
# මූල පරියාය සූත්‍රය

## මජ්ඣිම නිකාය



සියල්ලට

මූල

නොදන්නාකමයි

සදහම් නොදැනීම

ප්‍රපඤ්ච වඩයි.




නාවිමන ආරණ්‍ය සේනාසනය

මාකුර, අඹේපුස්ස. ☎ 035-3350651 | 071-4237054

✉ navimanasl@gmail.com

https://navimanafm.wixsite.com/navimana

- අතීත කථාව - මූල පරියාය ජාතකයෙන්.
- වර්තමාන කථාව - මූලපරියාය සූත්‍රයෙන්.

<u>පටුන-</u>

පිටු අංක 01. - 02. සූත්‍ර දේශනාව

03. - 06. අර්ථකථා විස්ථර සැකෙවින්.

07. සාරාංශය.

**<u>මූල පරියාය ජාතකයෙන්-</u>**

බෝසතානන් වහන්සේ දිසාපාමොක් ආචරියන් වහන්සේව සිටි එක් සමයක ශිල්ප උගන අවසන සිය ගෝල පිරිස මානයෙන් මත්ව ගුරු උවටැන පවා නතර කලහ. දිනක් කිහිරි ගස් සෙවනක වැඩසිටින ගුරුතුමන් වෙත පැමිනි එම පිරිස එම ගසෙහි පොත්ත නිය අගින් තුවාලකොට කිසිසාරයක් නැතැයි බෝසතාණන් වහන්සේට (ඇදුරුතුමාට) ඇසෙන්නට කීහ. එය වටහාගත් ඇදුරුතුමන් ගෝල පිරිසෙහි මානය බිදීම පිනිස ''පැනයක් ඇත. එය විසඳව'' යි කීහ. එයට කැමතිවූ එම පිරිසට මෙම ගාථාව දේශනා කලේය. දින ගණනකටවත් පිලිතුරු සොයනු නොහැකිවූ එම පිරිස තම මන් බිදී ඇදුරුතුමන්ට කීකරු විය.

''කාලො ඝසති භූතානි, සබ්බානෙව සහත්තනා;
යො ච කාලඝසො භූතො, ස භූතපචනිං පචී''ති.

**<u>අර්ථය -</u>**

මතුපිටින් පෙනෙන අර්ථය - තමා සමග සියලුදේ සියලු භූතයන් කාලයා විසින් ගිලදමයි. යම් ඒ කාලය ගිලදමන්නාවූ භූතයෙක් වේද සියලු භූතයන් පුලුස්සා දමයි.

**<u>අන්තර්ගත සැබෑ අර්ථය-</u>**

ගෙවීයන කාලයත් සමගම සියලු සංස්කාරයෝද තමාද ඇතුලුව මොහොතක් පාසා විනාශ වෙත්. අනිත්‍ය වෙත්. කාලය මනාසේ ප්‍රයෝජනයට ගන්නා රහතන් වහන්සේ සසර දුකට හේතුවන තණ්හාව ආර්ය මාර්ග ඥාණයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කරන්නේය.

ඇදුරු තුමන් මෙසේ අවවාද කර නැවත දහම් මගෙහි පිහිටුවීය.

''බහූනි නරසීසානි, ලොමසානි බ්‍රහානි ච;
ගීවාසු පටිමුක්කානි, කොචිදෙවෙත්ථ කණ්ණවා''ති

*බොහෝ මිනිසුන්ට තල්ගෙඩියක් වගේ ඔළුගෙඩියක් තිබුණත් පිරික්සා බැලුවිට තල්මදය තරම්වත් (කන් සිදුරක් තරම්වත්) නුවණක් නැත.*

# මජ්ඣිමනිකායො

## මූලපණ්ණාසපාළි

### 1. මූලපරියායවග්ගො

### 1. <u>මූලපරියායසුත්තං</u>

1. එවං මෙ සුතං – එකං සමයං භගවා උක්කට්ඨායං විහරති සුභගවනෙ සාලරාජමූලෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි – ''භික්ඛවො''ති. ''භදන්තෙ''ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච – ''සබ්බධම්මමූලපරියායං වො, භික්ඛවෙ, දෙසෙස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමී''ති. ''එවං, භන්තෙ''ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච –

| | | |
|---|---|---|
| ස්ථානය | උක්කට්ඨා නුවර සුභගවනයේ සල්රුක් මුලදී | ''සබ්බධම්මමූලපරියායං වො, භික්ඛවෙ, දෙසෙස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමී''ති. ''එවං, භන්තෙ''ති |
| දේශනාව | **සබ්බ මූල පරියාය (මූලපරියාය සූත්‍රය) (සියලු සත්කාය ධර්මයනට මූල කාරණය)** | |
| | පඨවි ආදී සතර මහා භූතරූප ගැන නොදත් අශ්‍රැතවත් පුථුජනයෝ ඒ පඨවි ආදිය "මමය, මගේය " ආදී ලෙස **තණ්හා දිට්ඨි මාන** වශයෙන් ගෙන එහි අභිනන්දනය කරයි. | ''ඉධ, භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී ....... සප්පුරිස ධම්මෙ අවිනීතො – පථවිං පථවිතො සඤ්ජානාති; පථවිං පථවිතො සඤ්ඤත්වා පථවිං මඤ්ඤති, පථවියා මඤ්ඤති, පථවිතො මඤ්ඤති, පථවිං මෙති මඤ්ඤති, පථවිං අභිනන්දති. තං කිස්ස හෙතු |
| | එලෙස සිතන්නට හේතුව- මහාභූත පිළිබඳ නොදැනීම. | ? 'අපරිඤ්ඤාතං තස්සා'ති වදාමි. |
| | එලෙසම -භූතයන් (චාතුම්මහා රාජිකයෙන් පහළ සත්වයන්), දෙවියන්, ප්‍රජාපතී (මාරයා), බ්‍රහ්මයන්, | |
| | තවද- රූපායතනය, ශබ්දායතනය, <u>ගන්ධායතනය, රසායතනය, ඓාට්ඨබ්බායතනය (මුත)</u> සහ විඤ්ඤාතය හෙවත් ධම්මායතනය තණ්හා වශයෙන් ගනියි. | |
| 1. පුථුජන පරිච්ඡේදය | තවද- වේදනාදී නාමස්ඛන්ධ 4 එකක් ලෙස ගෙන,හෝ ඒවා නානාත්වයෙන් ගෙන සියලු සත්කාය ධර්ම එකක් ලෙස සලකයි. නිර්වාKය (පරම දිට්ඨධම්ම නිර්වාණය), මේ එක එකක් ගැන මම මගේ මම ඒතුල වෙමි ආදී ලෙස සිතයි. ඊට හේතුව ඒවාගැන පිරිසිඳ නොදැනීමයි | මෙලෙස පුථුජන ලෙස පලමු භූමි පරිච්ඡේදය දේශනාකලා |

| | | |
|---|---|---|
| 2.<br><br>සේඛ<br>පරිච්ඡේදය | දෙවනුව සේඛයන් වහන්සේලාගැන පවසමින් පඨවි ආදී ඉහත සියල්ල මනාසේ දනියි. එනිසා මම (පඨවි) නොවෙයි, මම (පඨවියේ) පිහිටියේත් නොවෙයි, මගේ ආත්මය (පඨවියෙන්) බැහැර පිහිටියේත් නොවෙයි, (පඨවි) ධාතුව මගේ යැයි දෘෂ්ඨි වශයෙන් නොසිතුවද, තණ්හාමාන වශයෙන් හැඟීම් නැතුවාම නොවේයි.<br>මක්නිසාද?<br>ඒවා මනාසේ **<u>දතයුතු නිසා.</u>** | ‘‘යොපි සො, භික්ඛවෙ, භික්ඛු සෙක්ඛො අප්පත්තමානසො අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානො විහරති, සොපි පථවිං පථවිතො අභිජානාති; පථවිං පථවිතො අභිඤ්ඤාය පථවිං මා මඤ්ඤි , පථවියා මා මඤ්ඤි, පථවිතො මා මඤ්ඤි, පථවිං මෙති මා මඤ්ඤි, පථවිං මාභිනන්දි තං කිස්ස හෙතු? ‘**<u>පරිඤ්ඤෙය්‍යං</u>** තස්සා’ති වදාමි. |
| 3.<br>අසේඛ<br>පරිච්ඡේදය | ඉන්පසු රහත් උතුමන් පිළිබඳ වදාලසේක්,ගෙවූ ආස්‍රව ඇති, වැස නිමකල බඹසර ඇති, සිව්මග කිස නිමාකල, කෙලෙස්බර බහාලූ, බව බන්ධන ක්ෂයකල ක්ෂීණාස්‍රවයන් වහන්සේ<br>ඒ පඨවි ආදී සියල්ල මනාසේ දැනසිටින නිසා, ඒවා පිලිබඳ ඒ ආත්මය, ආත්මය ඒ තුල ඇත, ආත්මය එයින් බැහැරව ඇත. ඒ මාගේය. යන හැඟීමක් කිසිලෙසකවත් නැත. එලෙස හැඟීමෙන් අභිනන්දනය නොවෙයි.<br>මක් නිසාද?<br>ඒවා මනාසේ **<u>දන්නා නිසා.</u>** | ‘‘යොපි සො, භික්ඛවෙ, භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො, සොපි පථවිං පථවිතො අභිජානාති; පථවිං පථවිතො අභිඤ්ඤාය පථවිං න මඤ්ඤති, පථවියා න මඤ්ඤති, පථවිතො න මඤ්ඤති, පථවිං මෙති න මඤ්ඤති, පථවිං නාභිනන්දති. තං කිස්ස හෙතු? ‘**<u>පරිඤ්ඤාතං</u>** තස්සා’ති වදාමි. |
| 4.<br>අසේඛ<br>පරිච්ඡේදය | නැවතද රහතන් වහන්සේ ගැන විස්ථර කරමින් ඉහත කිසිවක් කෙරෙහි නොඇලෙයි අභිනන්දනය නොකරයි යැයිවදාලා. ඊට හේතුව-<br>1. රාගය ක්ෂයකර වීතරාගී වූනිසා.<br>2. ද්වේෂය ක්ෂයකර වීතද්වේෂී වූනිසා.<br>3. මෝහය දුරුකර වීතමෝහී වූනිසා | ‘‘යොපි සො, භික්ඛවෙ, භික්ඛු අරහං........පෙ...... තං කිස්ස හෙතු? ඛයා රාගස්ස, වීතරාගත්තා.<br>ඛයා දෙසස්ස, වීතදෙසත්තා.<br>ඛයා මොහස්ස, වීතමොහත්තා. |
| 5.<br>තථාගත<br>පරිච්ඡේදය. | ඉන්පසු තථාගතයන් වහන්සේ පිළිබඳවද ඉහත ක්ෂිණාස්‍රවයන් වහන්සේ පිළිබඳ විස්තරය ලෙසටම දේශනා කලසේක්.<br>මක්නිසාද යත්?<br>නන්දි සංඛ්‍යාත තණ්හාව දුකට මුලයි. භවයේ උපතට හේතුවෙයි. ජරාමරණය වේයැයි දැන. එම තණ්හාව සහමුලින්ම සිඳදමා, නිරෝධයෙන්, ත්‍යාගයෙන්, දුරලීමෙන්, අනුත්තර සම්‍යක් සම්බෝධියට පත්වූ හෙයිනි. | ‘‘තථාගතොපි, භික්ඛවෙ, අරහං සම්මාසම්බුද්ධො **<u>.... ‘පරිඤ්ඤාතං තං</u>** තථාගතස්සා’ති වදාමි.<br>‘නන්දී දුක්ඛස්ස මූල’න්ති – ඉති විදිත්වා ‘භවා ජාති භූතස්ස ජරාමරණ’න්ති.<br>තස්මාතිහ, භික්ඛවෙ, ‘තථාගතො සබ්බසො තණ්හානං ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො’ති වදාමි. |

මූල පරියාය සූත්‍රය අර්ථ-

තථාගතයන් වහන්සේ දම් දෙසන හේතු 4ක්-

1. අත්තජ්ඣාස- අන්කෙනකුගේ අදහසට නොව තමන් වහන්සේගේම අදහසට අනුව එම අවස්ථාවට ගැලපෙන ලෙස කරනු ලබන දේසනා- ආකංඛෙයිය, මහාසතිපට්ඨාන, අරියවංස වැනි සූත්‍ර දේසනා.
2. පරජ්ඣාස- අන් අයකුගේ මනසේ ස්වභාවයට අනුව එම අවස්ථාවට අදාලව කල දේසනා- චූල රාහුලෝවාද, මහාරාහුලෝවාද, ධම්මචක්ක, ධාතුවිභංග වැනි සූත්‍ර දේසනා.
3. පුච්ඡාවාසිකා- තථාගතයන් වහන්සේ ගෙන් දෙව් මිනිස් මාර බ්‍රහ්ම ආදී අය පැමිණ ප්‍රශ්න ඇසූවිට එයට පිළිතුරද විස්තර කරන දේසනා-
4. අට්ඨුප්පත්ති- යම්විටක යම් කරුණක් පැමිණි විට එයට අදාලව කරනුලබන දේසනා. ධම්මදායාද, දාරුක්ඛන්දූපම, චන්දූපම, වෙණපිණ්ඩූපම වැනි සූත්‍ර දේසනා
මෙම සබ්බමූල පරියාය සූත්‍රයද සිව්වන අට්ඨුප්පත්ති දේසනාවකි.
ත්‍රිපිටක ධර්මය හොඳින් දැන උගෙන එයින් මානයට පත්ව බුදු උවටැන පවා ප්‍රතික්ෂේපකල භික්ෂූන් පිරිසක් අරබයා එහි අදීනව පවසනු පිණිස වදාල දෙසුමකි. (මෙහි අතීත කථාව මූල පරියාය ජාතකයෙහි දැක්වේ)
සබ්බ මූල පරියාය- සියළු (ඉතිරි නැතුවම) හේතු කාරණා (සක්කාය හෙවත් පංචස්ඛන්ධය පිලිබඳ වැරදි වැටහීම ගැන)
අසුතවත් - ධර්මය නොදත් එනම්- ස්ඛන්ධ ධාතු ආයතන හේතුඵලදහම් විමසා දැනගැනීම් ආදියෙන්තොර.
පෘතජ්ජන- පුථූනං ජනනාදීහි, කාරණෙහි පුථුජ්ජනො;
පුථුජ්ජනන්තොගධත්තා, පුථුවායං ජනො ඉති.
**පුථුජ්ජනො.** – පුථු කිලෙසෙ ජනෙන්තීති පුථුජ්ජනා,
**ලෞකික වූද විවිධාකාර කෙලෙස් උපදවන්නා වූද, යන අර්ථයෙන් පෘතජ්ජන නම් වෙති.**
දුවෙ පුථුජ්ජනා වුත්තා, බුද්ධෙනාදිච්චබන්ධුනා;
අන්ධො පුථුජ්ජනො එකො, කල්‍යාණෙකො පුථුජ්ජනොති. –
පෘතජ්ජනයෝ දෙදෙනෙකි- අන්ධ පෘතජ්ජන සහ කල්‍යාණ පෘතජ්ජන.
**අරියානං අදස්සාවීති-** අරියාති ආරකත්තා කිලෙසෙහි, කෙළෙස් දුරුකලාවූ යනු **ආර් ය** නම්වේ.එනම් බුදු පසේබුදු තථාගත ශ්‍රාවක උතුමෝය.
**දස්සන** - දැකීමයි. දැකීම ආකාර 2කි. ඇසෙන් දැකීම. නුවණින් දැකීම.
**අරියානං අදස්සාවී - යන මෙහි දැක්වෙන්නේ ආර් යධර් මය නුවණින් නොදකින අර් ථ යි.**
**සප්පුරිසාති-** තෙ හි ලොකුත්තරගුණයොගෙන සොභනා පුරිසාති සප්පුරිසා.
**මාර් ග ඵල සංඛ්‍යාත ලොව්තුරු ගුනයෙන් සමන්විත යනුයි.**

**“යො වෙ කතඤ්ඤූ කතවෙදි ධීරො,කල්‍යාණමිත්තො දළ්හභත්ති ච හොති;**
**දුඛිතස්ස සක්කච්ච කරොති කිච්චං,තථාවිධං සප්පුරිසං වදන්ති”ති**
කියන දේ කරන කරන දේ කියන, බුද්ධිමත්, සසරගමනෙහි දුකටපත් සත්වයනට උපකාර කරන යමෙක් වේද, ඒ සත්පුරුෂයෝ ය.
**අරියධම්මස්ස අකොවිදොති-** සතිපට්ඨානාදිභෙදෙ අරියධම්මෙ අකුසලො-
සතිපට්ඨානාදී ආර් ය ධර් මයෙහි අදක්ෂ වූ

අරියධම්මෙ අවිනීතොති- ආර් ය දහමෙහි නොහික්මෙන. හික්මීම හෙවත් සික්ෂාව නම් සංවරවීම පිණිසමයි. *(විනයෝ සංවරත්ථාය.)*ඒ සංවරය ආකාර 5කි.සීල සංවරය,සති සංවරය,ඤාණ සංවරය,ඛන්ති සංවරය,විරිය සංවරය

| | | |
|---|---|---|
| | සීල සංවරය, | චතුපාරිශුද්දි සීලයෙන් යුතුවීම. |
| | සති සංවරය, | චක්ඛු ආදී ඉන්ද්‍රිය සංවරකරගැනීම(ඉන්ද්‍රියසංවරසීලය) |
| | ඤාණ සංවරය, | නුවනින් සලකා සංවරවීම(ප්‍රත්‍යාවෙක්ෂාව) |
| | ඛන්ති සංවරය, | සීත උෂ්ණ ආදී බාධක ඉවසීම. |
| | විරිය සංවරය, | කාම විතක්කාදිය සිතට නොගැනීම. |

විනය- සික්ෂාකාමී බව- ආකාර 2කි.

| | | |
|---|---|---|
| | සංවර විනය | සීලසංවරො සතිසංවරො ඤාණසංවරො ඛන්තිසංවරො වීරියසංවරො පඤ්චවිධො. ආකාර 5කි. |
| | පහාන විනය | තදඞ්ගපහානං වික්ඛම්භනපහානං සමුච්ඡෙදපහානං පටිප්පස්සද්ධිපහානං නිස්සරණපහානන්ති පඤ්චවිධො. |

| | | |
|---|---|---|
| | තදඞ්ගපහානං | නාමරූප පරිච්ඡේදයේ පටන් සංඛාරුපෙක්ඛා දක්වා |
| | වික්ඛම්භනපහානං | සමාධියෙන් නීවරණ සංසිඳවීම |
| | සමුච්ඡෙදපහානං | ආර් ය මාර් ග යෙන් කරන සම්පූර් ණ(ඉතිරි නැතිව) කෙලෙස් ප්‍රහානය |
| | පටිප්පස්සද්ධිපහානං | ඵල සමාපත්ති අවස්ථාව |
| | නිස්සරණපහානං | නිර් වා න ය |

- පඨවි- මෙය ආකාර 4කි.

1. ලක්ඛණ පඨවි- කර් කෂවූ යන ලක්ෂණ යෙන් හඳුන්වන
2. සසම්භාර පඨවි- ආඣාත්මික කයෙහි ඇති
3. ආරම්මණ පඨවි- භාවනා අරමුණු ලෙ ගන්නා කසිණ
4. සම්මුති පඨවි- පඨවි ලෙස සම්මත කරගත්

මේ කුමක් නමුත් සම්මුතියක්ලෙස පඨවි සඤ්ඤාවෙන් ගැනිමෙන්, මෙය සත්වයෙක්ය. මෙය ත්වයකුට අයත්ය ආදි ලෙස අදහස් මතුවේ. එය ලෝබ දිට්ඨි මාන ආදී ප්‍රපඤ්ච ධර් ම ඇතිවීමට හේතුවේ. මක් නිසාද පටවිය ගැන මනාසේ නොදත් නිසා.

පඨවි- 1.ආඣාත්මික පඨවි- සිරුරේ තද ගතිය ඇති කොටස් මේවා 20කි. කොටස් 32 හි කෙස්වල සිට......මොළය දක්වා කොටස්(ලස්සන ආදීලෙස දැකීමෙන් මේවා කෙරෙහි ප්‍රපඤ්ච ඇතිවන අයුරු සිතා බලන්න).

2. බාහිර පඨවි- බාහිර පරිසරයේ හමුවන අනුපාද්න්නක හෙවත් අජීවී සියල්ල.( ලස්සන ් ගය ආදීලෙස දැකීමෙන් මේවා කෙරෙහි ද ප්‍රපඤ්ච ඇතිවන අයුරු සිතා බලන්න).සම්පත්ති මෙන්ම විපත්ති නිසාද කෙලෙස් උපදිනයුරු බලන්න.

මේ සම්මුති රූපය දකිමින් එය නිසා ම මම මගේ මගේ ආත්මය කියා කොතරම් වාර ගණනක් සිතුවිලි මතුවෙනවද, ඒ අනුව කො තරම් අභිනන්දනය කරනවද සහ දුක්වෙනවද සිතා බලන්න.
එයට හේතුව නොදැනිමමයි. අපරිඤ්ඤාතං.
මනාසේ දැනගැනි ම පරිඤ්ඤා නම් වේ . පරිඤ්ඤා වර්ග 3කි.

| | | | |
|---|---|---|---|
| 1 | ඤාත පරිඤ්ඤා | ලක්ඛණ,රස,පච්චුපට්ඨාන.පදට්ඨාන පිළිපද දැනීම | නාමරූප වවත්ථානය |
| 2 | තීරණ පරිඤ්ඤා | අනිත්‍යාදී ත්‍රිලක්ෂණයට අනුව දැක තීරණය | කලාප සම්මර් ෂනයේ සිට අනුලොම ඤාණය තෙක් |
| 3 | පහාන පරිඤ්ඤා | ඒවා කෙරෙහි ඇති ඡන්දරාගය අරිය මගින් නැතිකරදැමීම | ආර් ය මග්ග ඤානයෙන් ප්‍රහානය |

- ඉන්පසු විස්ථර කල ආපෝධාතු ආදියද මෙලෙසම ආඣාත්මික බාහිර ආදි විස්ථර අනුව සිතන්න.

| | පඨවි | ආපෝ | තේජෝ | වායෝ |
|---|---|---|---|---|
| ආධ්‍යාත්මික-(ස්වකීය කයෙහි ඇති .) | කොටස් 20කි ඇති තදගතිය අධික කොටස්. | කොටස් 12කි. ඇති දියරගතිය අධික කොටස් | කොටස් 4කි. ඇති උෂ්ණගතිය අධික කොටස් | කොටස් 6කි. ඇති වායුගතිය අධික කොටස් |
| බාහිර(ස්වකීය සිරුරෙන් බැහැර අජීවී දේ) | | | | |
| ලක්ඛණ | කර් කශ | වැගිරෙන(පග්ඝරණ) | උෂ්ණ(උණ්හත්ත) | පිම්බෙන(විත්ථම්බන) |
| සසම්භාර | ආධ්‍යාත්මික | ආධ්‍යාත්මික | ආධ්‍යාත්මික | ආධ්‍යාත්මික |
| ආරම්මණ | කසිණ | කසිණ | කසිණ | කසින |
| සම්මුති | සම්මත කරගත් දේ | සම්මත කරගත් දේ | සම්මත කරගත් දේ | සම්මත කරගත් දේ |

- භූතවාර----

භූතෙ භූතතො සඤ්ජානාති ති. භූත, භූත ලෙස දකියි. භූත යන වචනය විවිද අරුත් දෙති. මෙම සූත්‍රෙයහි සත්ව යන අර්ථයෙනි. එනම් චාතුර්මහා රාජිකයෙන් පහල සියලු සත්ව කොට්ඨාශයෝ ය. ඒ අනුව සිව් අපා සත්වයන්ද මනුෂ්‍යයන් ද ඇතුලත්වේ.

භූත අරුත්- ***පඤ්චක්ඛන්ධඅමනුස්සධාතුවිජ්ජමානඛීණාසවසත්තරුක්ඛාදීසු***

**භූතෙ භූතතො සඤ්ජානාති ති-** යන මෙයින් අදහස් කරන්නේ ඉහත කී සියලු සත්වයන් නිත්‍ය,සදාකාලික,වෙනස්නොවන දෑ ලෙස දිට්ඨිගතවීම. ඒ අනුව මානය ඇතිකරගැනීම,සහ තණ්හාව උපදවීමයි(ප්‍රපඤ්ච)
එයට හේතුව නොදැනිමමයි. අපරිඤ්ඤාතං.

- දේව වාරය-----

දෙවෙ දෙවතො ති. සඤ්ජානති.

මෙහි දේවා යනු- ***තත්ථ දිබ්බන්ති පඤ්චහි කාමගුණෙහි අත්තනො වා ඉද්ධියාති ද, කීළන්ති ජොතෙන්ති වාති අත්ථො.*** පස්කම් සැපයෙහි තමාව විනෝදවන්නේ යන අර් ථයෙන් දේව නම් වේ.
දෙවිවරු කොටස් 3කි.

1. සම්මුති දේව- රජවරු ආදි සම්මතකරගත් අය ''දේවයන්වහන්ස'
2. උප්පත්ති දේව- චාතුර්මහාරාජිකයෙන් ඉහල (තාවතිංස.යාම,තුසිත,නිම්මානරතිය,පරනිම්මිත වසවත්තිය)මේ ස්ථානවල උපන් සත්වයෝ
3. විසුද්ධි දෙව- ක්ෂිණාශ්‍රව මහරහත් උතුමන්

මෙම සූත්‍ර දේසනාවේ උප්පත්ති දේව යන කොටස අවධානයට යෙදේයි. වැරදි හැඟිම නිසා ප්‍රපඤ්ච ධර් ම ඇතිවේ. ඊට හේතුව නොදන්නා කමයි.අපරිඤ්ඤාතං

- පජාපතී----

පජාපතී,පජාපතිස්මිං, පජාපතිතා
ප්‍රජාවට අධිපති හෙයින් පජාපතීනම්වේ. මෙය වෙසෙසින් දෙවියන්ගේ නායකයාට යෙදෙන නමකි. මෙම සූත්‍ර දෙසුමට අනුව මාරයාට යෙදුනමක්ලෙස දැක්වේ.
මාරයාගේ රුව දැක්මෙන් ලොබයද, ආයු දැක්මෙන් දිට්ඨියද, බලය දැක්මෙන් මානයද යන පපඤ්චයෝ ඇතිවේ.
මක්නිසාද? මනාසේ නොදත් නිසා.අපරිඤ්ඤාතං.

- බ්‍රහ්ම-----

මෙම වදනද විවිධ අර් ථයන්හි යෙදෙති. *බ්‍රහ්මං බ්‍රහ්මතොති එත්ථ බ්‍රෑහිතො තෙහි තෙහි ගුණවිසෙසෙහීති බ්‍රහ්මා*(ඒඒ ගුණ විශේෂයන්ගෙන් සමන්විත හෙයින්බ්‍රහ්ම නම්වේ.

- ''*බ්‍රහ්මාති ඛො, භික්ඛවෙ, තථාගතස්සෙතං* අධිවචන''න්ති (තථාගතයන් වහන්සේ).
- ''*බ්‍රහ්මාති මාතාපිතරො, පුබ්බාචරියාති වුච්චරෙ''ති*(මව්පියන්)

මෙහි බ්‍රහ්ම ලෙස විස්ථර වන්නේ රූපී සහ අරූපී බ්‍රහ්මයෝය.
ඔවුන් දැක්මෙන්ද පපඤ්ච ධර් මයන් ඇතිවෙ
මක්නිසාද? මනාසේ නොදත් නිසා.අපරිඤ්ඤාතං.

- නිබ්බාන වාරය-----

පරමදිට්ටධම්මනිබ්බානය ලෙස මෙහි දැක්වෙන්නේ පස්කම් සැප උපරිමෙන් ලැබීමේ අවස්ථාවයි. මෙය දිට්ඨිගතිකයන්ගේ වදනකි. එය ලැබීමත් පැතීමත් පපඤ්ඤ ඇතිවීමට හේතුවේ. එසේ කරන්නේද නොදන්නකම නිසාය.අපරිඤ්ඤාතං

- දිට්ඨාදිට්ඨ වාරය ------

සක්කාය හෙවත් ආත්ම සඥාව නිසා පපඤච දහම් වැඩෙන ත්‍රයිභූමික කරුණු කැටිකොට තවදුරටත් විස්තර කරණු පිණිස දිට්ඨ සුත මුත විඤ්ඤාත ලෙස දක්වයි.

| | | |
|---|---|---|
| | දිට්ඨ | දස්සනය හෙවත් දැකීම මාංසමය ඇසෙන්ද දිව්‍යමය ඇසෙන්ද කලහැකියි. මෙහි මෙය රූපායතනය හෙවත් රූප සංතතියට යෙදූ නමකි. එය වැරදිලෙස දැක්මෙන් තණ්හා දිට්ඨි මාන (පපඤ්ච) ඇතිවේ. |
| | සුත | ශ්‍රවනය හෙවත් ඇසීම මාංසමය කනෙන්ද දිව්‍යමය කනෙන්ද කලහැකියි. මෙහි මෙය ශබ්දායතනය හෙවත් ශබ්දරූප සංතතියට යෙදූ නමකි. එය වැරදිලෙස දැක්මෙන් තණ්හා දිට්ඨි මාන (පපඤ්ච) ඇතිවේ. |
| | මුත | ගන්ධ රස ස්පර්ෂයන ට මෙය විශේෂ යෙදුමකි. ඉහත පද අනුව පපඤ්ච වනයුරු සිතාබලන්න. |
| | විඤ්ඤාත | ඉතිරි චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන, ධම්ම යන ආයතන 7 ඇතුලත්ව ධම්මායතනයට විශේෂ යෙදුමකි. පපඤ්චවනයුරු ඉහතවිස්ථරයට අනුව සිතන්න. |

- ඒකත්ත වාරය----- සියල්ල(ස්කන්ධ) එකක් ලෙස(සමාපන්නක)ගැනීම.
- නානත්ත වාරය---- ස්කන්දයන් වෙනවෙනම සලකා දිට්ඨිගතවීම. ***එනම් රූපය මම. මමරූපයතුල සිටී , රූපය මාතුල සිටී, රූපය මගේය. යනාදී ලෙස.***

<u>සබ්බං සබ්බාති</u> - සියල්ල මවන්නෙක් ඇත. සියල්ල පෙර කර්ම අනුව වේ. සියල් අහේතුකය ආදී දිට්ඨිගතවීම

- සේඛ වාරය------

*සික්ඛතීතිපි සෙක්ඛො. වුත්තඤ්හෙතං ‘‘සික්ඛතීති ඛො භික්ඛු තස්මා සෙක්ඛොති වුච්චති. කිඤ්ච සික්ඛති? අධිසීලම්පි සික්ඛති, අධිචිත්තම්පි සික්ඛති, අධිපඤ්ඤම්පි සික්ඛති, සික්ඛතීති ඛො භික්ඛු තස්මා සෙක්ඛොති වුච්චතී’’ති (අ. නි. 3.86).*
හික්මෙන්නාවූ යන අර් ථයෙන් සේඛ නම් වේ. කුමක් කෙරෙහි හික්මෙන්නෙද යත්,අධිසිල, අධි සික්ඛා, අධි පඤ්ඤා හි හික්මෙන්නේ ය.

***‘යොපි කල්‍යාණපුථුජ්ජනො අනුලොමපටිපදාය පරිපූරකාරී සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ ජාගරියානුයොගමනුයුත්තො පුබ්බරත්තාපරරත්තං බොධිපක්ඛියානං ධම්මානං භාවනානුයොගමනුයුත්තො විහරති – ‘‘අජ්ජ වා ස්වෙ වා අඤ්ඤතරං සාමඤ්ඤඵලං අධිගමිස්සාමී’’ති, සොපි වුච්චති සික්ඛතීති සෙක්ඛොති. ඉමස්මිං පනත්ථෙ පටිවෙධප්පත්තොව සෙක්ඛො අධිප්පෙතො, නො පුථුජ්ජනො’*** [යම් ඒ් කල්‍යාණ පථුජ්ජනයෙක් සිලයෙන්,ඉන්ද්‍රිය සංවරයෙන්, භෝජනයේ පමණදැනීමෙන්, නිදිවරා ගුණපිරීමෙන් යුතුව, රාත්‍රියේ පූර් ව සමයේද පසු සමයේද. බෝධි පාර් ශ්වික දම් පුරයිද, අදහෙටම යම් මාර් ග ඵලයක් අධිගම කරන්නේය. ඔහු ඉතිරි මාර් ග ඵල සඳහා හික්මෙන්නේනුයි සේඛ නම් වෙති.]

- ඛීණාසව වාරය----

ආශ්‍රවයන් ක්ෂයකල හෙයින් ක්ෂිණාශ්‍රව නම්වේ. ආසව හෙත් ආශ්‍රව යනු පල්කරන අර්ථයි. සසරගමනේ රඳවාතබන නිසා ආශ්‍රවනමින් දක්වන ධර් මතා 4ක් වේ (කාමාසව,භවාසව,දිට්ඨාසව,අවිද්‍යාසව)

**අරහන්ති** ආරකකිලෙසො, දූරකිලෙසො පහීනකිලෙසොති අත්ථො. වුත්තඤ්චෙතං භගවතා ‘‘කථඤ්ච, භික්ඛවෙ, භික්ඛු අරහං හොති? ආරකාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොබ්භවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා. එවං ඛො, භික්ඛවෙ, භික්ඛු අරහං හොතී’’ති. (ම. නි. 1.434) ඛීණාසවොති චත්තාරො ආසවා කාමාසවො…පෙ…. අවිජ්ජාසවො, ඉමෙ චත්තාරො ආසවා අරහතො ඛීණා පහීනා සමුච්ඡින්නා පටිප්පස්සද්ධා, අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, තෙන වුච්චති ඛීණාසවොති.

**වුසිතවාති** - ආර්ය මාර්ගයෙහි නිසි ලෙස හැසිරුනා යනුයි.

**කතකරණීයොති** චතුසත අවබෝධය පිණිස කලයුතු සියල්ල නිමකල හෙයින්,දුඛ කෙලවර කිරීමට තවත්කලයුතු දෙයක් නැති හෙයිනි.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | පෘථග්ජන | ආර් ය | | |
| | | | ලෞකික | ලෝකෝත්තර | | |
| | | | සසරේ බැඳුන | සසරබැමි සිඳින | | |
| | | | ප්‍රපඤ්ච වඩන | ප්‍රපඤ්ච නොවඩන(තණ්හා දිට්ඨි මාන) | | |
| | | | | | | |
| | | | අපරිඤ්ඤාත (ධර් මය නොදත්) | පරිඤ්ඤෙය්‍යා (ධර් මය තවත් දැනගැනීමට ඇති) | පරිඤ්ඤාත (ධර් ම ය දන්නා) | |
| | | | පෘථග්ජන | සේඛ | අසේඛ | සම්බුද්ධ |
| | මහා භූත | පඨවි | තණ්හා දිට්ඨි මාන (ප්‍රපඤ්ච )ඇතිවේ. | දිට්ඨි වශයෙන් නොගනී තණ්හාමාන සියුම්ව ඇත. | ප්‍රපඤ්ච නැත. | ප්‍රපඤ්ච නැත. |
| | | ආපෝ | | | | |
| | | තේජො | | | | |
| | | වායෝ | | | | |
| | බාහිර ආයතන | වර් ණ(රූපායතනය) | | | | |
| | | ශබ්ද(ශබ්දායතනය) | | | | |
| | | ගන්ධ(ගන්ධායතනය) | | | | |
| | | රස(රසායතනය) | | | | |
| | | ස්පර් ෂ(ඵොට්ඨබ්බ) | | | | |
| | | ධම්මායතනය | | | | |
| | ආධ්‍යාත්මික ආයතන | චක්ඛායතන | | | | |
| | | සෝතායතන | | | | |
| | | ඝානායතන | | | | |
| | | ජිව්හායතන | | | | |
| | | කායායතන | | | | |
| | | මනායතන නාමස්ඛන්ධ 4 | | | | |
| | භූමි තල 31 | භූත(මිනිස්ලොව සහ සතර අපා) | | | | |
| | | දේව(සදෙව්ලොව) | | | | |
| | | බ්‍රහ්ම(රූප/අරූප) | | | | |

ප්‍රපඤ්ච ඇතිතුරා සසරේ යාමට සිදුවේ. කලයුතුදේ ත්‍රිවිධ පරිඤ්ඤා වැඩෙන ලෙස කටයුතු කිරීමයි. ත්‍රිවිධ පරිඤ්ඤා ඉහතින් දක්වා ඇත.